# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2112/46 – 2019 මාර්තු 01 වැනි සිකුරාදා – 2019.03.01

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: අයිආර්/10/41/2009.

### කාර්මික ආරාවුල් පනත 131 වන අධිකාරිය

131 වන අධිකාරිය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තිය යටතේ 2010.06.07 දිනැති හා අංක 1657/4 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශෙෂ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද 2010.05.25 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් කුරුණෑගල, මල්කඩුවාව, මීගමු පාර, සියත පටුමඟ, අංක 124/ඒ, වින්ධ්‍යා සෙවනෙ හි පදිංචි ආර්. ගොඩැල්ලවත්ත හා අනෙක් පාර්ශ්වය වශයෙන් කොළඹ 03, ගාළු පාර, රොටුන්ඩා ටවර්, අංක 109 හි පිහිටි ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2018.11.25 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

ඒ. විමලවීර,
කම්කරු කොමසාරිස් ජනරාල්.

2019 පෙබරවාරි මස 21 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

1A – G 29561 – 13 (2019/03)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# ප්‍රදානය

**කාර්මික අධිකරණයේ දී ය.**

*නඩු අංකය: ඒ - 3335*

ආර්. ගොඩැල්ලවත්ත, ''වින්ධ්‍යා සෙවන'', අංක 124/ඒ, සියත පටුමග, මීගමු පාර, මල්කඩුවාව, කුරුණෑගල.

ඉල්ලුම්කරු

එදිරිව

ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව, අංක 109, රොටුන්ඩා ටවර්, ගාළු පාර, කොළඹ 03.

වගඋත්තරකරු

කම්කරු සබඳතා හා ඵලදායිතා ප්‍රවර්ධන අමාත්‍ය ගාමිණී ලොකුගේ මැතිතුමා විසින් ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) 131 වන පරිච්ඡේදය වන පනත්වලින් සංශෝධිත, කාර්මික ආරාවුල් පනතේ 4(i) වගන්තියේ ප්‍රතිපාදන යටතේ ඉහත නම් සඳහන් පාර්ශවකරුවන් අතරේ ඇති ආරාවුල බේරුම්කිරීම මගින් නිරවුල් කිරීම පිණිස මා වෙත යොමු කර ඇත.

ඒ අනුව දෙපාර්ශවය විසින්ම තම තමන්ගේ ප්‍රකාශන ඉදිරිපත් කිරීමෙන් පසු මෙම කරුණ විමසීම සඳහා නියම කර ඇත.

පළමු පාර්ශවය විසින් සාක්ෂි කැඳවීම ආරම්භ කරමින් ඉල්ලුම්කරුගේ සාක්ෂි ඉදිරිපත් කර ඒ1 සිට ඒ21 දක්වා ලේඛන ලකුණු කරමින් තම නඩුව අවසන් කරන බවට දන්වා ඇත.

දෙවන පාර්ශවය විසින් සාක්ෂි ඉදිරිපත් කරමින්, ආයතනය වෙනුවෙන් පුවක් දණ්ඩ ලොකු ආචාරීගේ රංජිත් (ලිපිකරු) හා ජී. පී. උපනන්ද (මානව සම්පත් නිලධාරි) යන අය සාක්ෂි දී ඇති අතර ආර්1 සිට ආර්39 (අ) දක්වා ලේඛන ලකුණු කරමින් දෙවන පාර්ශවය විසින් තම නඩුව අවසන් කරන බවට දන්වා ඇත.

දෙවන පාර්ශවය විසින් ලකුණු කරන ලද ලේඛනවල පිටපත් සහිතව ලිඛිත දේශන ඉදිරිපත් කර ඇත. පළමු පාර්ශවය විසින් ලිඛිත දේශනය ඉදිරිපත් කර ඇත. එහෙත් ලකුණු කරන ලද ලේඛන ඉදිරිපත් කර නැත.

දෙපාර්ශවය විසින්ම ඉදිරිපත් කරන ලද සාක්ෂි හා ලිඛිත දේශන ද ඉදිරිපත් කර ඇති ලේඛන ද මා විසින් පරීක්ෂා කර බලන ලදී.

මෙම නඩුව විමසීමට ගත් අවස්ථාවේ දෙවන පාර්ශවය විසින් මූලික විරෝධතාවයක් ඉදිරිපත් කරමින්, මෙකී බේරුම්කරණයට යොමු කර ඇති කරුණු සම්බන්ධයෙන් ප්‍රදානයක් කිරීමට මෙම කාර්මික අධිකරණයට අධිකරණ බලයක් නොමැති බවත්, බේරුම්කරණය සඳහා කර ඇති මෙම යොමු කිරීම දෝෂ සහගත බවටත් ප්‍රකාශ කර ඇති අතර ඉල්ලුම්කාර පාර්ශවය විසින් එකී විරෝධතාවය පිළිගැනීමට නොහැකි බවට ප්‍රකාශ කරන ලද හෙයින් මේ සම්බන්ධයෙන් දෙපාර්ශවයටම කරුණු දැක්වීමට අවස්ථාව ලබාදී ඇති අතර අනතුරුව ඒ සම්බන්ධව මූලික විරෝධතා නියෝගයක් ලබාදීම සඳහා කටයුතු කරන ලදී.

කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය මගින් ගරු ඇමතිතුමා වෙත පැවරී ඇති බලතල අනුව, කාර්මික ආරාවුලක් ඇති බවට සෑහීමට පත්ව බේරුම්කරණය වෙත යොමු කිරීම තුළින් අධිකරණ බලය ප්‍රතිස්ථාපනය වී ඇති හෙයින්, ආරාවුලට භාජනය වී ඇති කරුණු සම්බන්ධයෙන් පාර්ශවකරුවන් විසින් සාක්ෂි ඉදිරිපත් කිරීමෙන් පසු එකී සාක්ෂි සලකා බලා නිගමනයකට පැමිණීම යුක්ති සහගත හා සාධාරණවන බවට නිගමනය කරමින් මූලික විරෝධතාවය ඉවතලමින්, නියෝගයක් ලබාදී ඇති අතර පසුව නඩුව විමසීමට නියම කර ඇත. ඒ අනුව මෙම නඩුවේ විසඳීමට ඇති කරුණු සම්බන්ධයෙන් දෙපාර්ශවයෙන්ම සාක්ෂි මෙහෙයවීම කරගෙන යන ලදී.

ඉහත කී යොමුකිරීම මගින්, පාර්ශවකරුවන් අතර ආරාවුලට හේතු වී ඇති කරුණු වශයෙන් දක්වා ඇත්තේ,

01. ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාවේ සේවය කරන ආර්. ගොඩැල්ලවත්ත මහතා සම්බන්ධයෙන් ලබාදී ඇති අංක එස්සී(එෆ්ආර්) 35/2007 හා 2008.06.23 දිනැති ශ්‍රේෂ්ඨාධිකරණ නියෝගය පරිදි 2008.07.18 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි සංස්ථාව විසින් ඔහු නියමිත වැටුප් තලය මත නැවත සේවයේ පිහිටුවා තිබේ ද යන්න හා නොඑසේ නම් ආර්. ගොඩැල්ලවත්ත මහතාට හිමිවිය යුතු සහනයන් මොනවා ද?

02. ආර්. ගොඩැල්ලවත්ත මහතා 2008.07.18 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි නැවත සේවයේ පිහිටුවීම මත සංස්ථාව විසින් නිකුත් කරනු ලැබූ අංක 1686 හා 2007.11.06 දිනැති පිරිස් කාර්යාංශ චක්‍රලේඛය පරිදි වසර දහයකට (10) වැඩි

කාලසීමාවක් එකම ශ්‍රේණියක සිටින සේවකයකු වශයෙන් සළකා උසස්වීම් ලබාගැනීමට හිමිකම් ඇත්ද යන්න හා නොඑසේ නම් ඔහුට ලැබිය යුතු සහනයන් මොනවා ද යන්න හා

03. ආර්. ගොඩැල්ලවත්ත මහතා 1986.01.03 දින සිට ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාවේ අවුරුදු 20 ක අඛණ්ඩ සේවා කාලයක් සම්පූර්ණ කළ සේවකයකු වශයෙන් සළකා ''විසි (20) අවුරුදු සේවා සේවා තිළිණය'' සඳහා හිමිකම් ලබන්නේ ද යන්න පිළිබඳව වේ.

ඉල්ලුම්කරු විසින් ඉදිරිපත් කර ඇති සාක්ෂියට අනුව, 1986.01.06 වන දින ඒ7 ශ්‍රේණියේ කළමනාකාර අභ්‍යාසලාභී තනතුරට බැඳුන බවත්, ඉන් අනතුරුව 1989.01.01 වන දින ක්‍රියාත්මක වන පරිදි, සේවය ස්ථිර කිරීමෙන් අනතුරුව ප්‍රාදේශීය කළමනාකාරු දක්වා උසස්වීම් ලැබ සේවයේ යෙදී සිටියදී 1998.10.02 දින වහාම ක්‍රියාත්මක වන පරිදි සේවය අත්හිටවූ බවත් ඒ සම්බන්ධව චෝදනා පත්‍ර ඉදිරිපත් කිරීමෙන් පසු විනය පරීක්ෂණයක් පවත්වා අවසාන වීමෙන් පසු තවත් දෙවන විනය පරීක්ෂණයක් පවත්වන බවට 2006.12. 22 දින දන්වා සිටි බවත් ඒ අනුව දෙවන විනය පරීක්ෂණය ආරම්භ කරන ලද බවත් ප්‍රකාශ කර ඇත.

ඒ අතරතුර ඉල්ලුම්කරු විසින් අංක එස්සී(එෆ්ආර්) 35/2007 දරන මූලික අයිතිවාසිකම් නඩුවක් ඉදිරිපත් කරමින් අනෙකුත් කරුණු අතර එම චෝදනා පත්‍රය පදනම් කරගෙන දෙවෙනි විනය පරීක්ෂණයක් කැඳවීම තුළින් තමාගේ මූලික අයිතිවාසිකම් කඩවී ඇති බවට ප්‍රකාශ කර ඇති අතර, එකී නඩුව දෙපාර්ශවය අතරේ සමථයකට පත් වී ඇත.

එකී සමථ නියෝගයේ සහතික පිටපතක් ඉදිරිපත් කර ඇත. එය පහත උපුටා දක්වා ඇත.

“Sarath N. Silva CJ

Counsel for the 1st, 2nd, 3rd respondants submits that it has been decided to reinstate the petitioner with effect from the date of interdiction with back wages. The petitioner has therefore received the entire relief that he has sought in the application counsel for the petitioner submits that there is concern regarding the place and the position to which the petitioner will be posted. The concern could be expressed only after such action is taken and may be the subject matter of any other proceedings, proceedings are terminated no costs.

මේ අනුව 2008.07.09 වන දින ලිපිය මගින් පසු පඩි සහිතව ඔහු නැවත සේවයේ පිහිටුවා ඇති නමුත් 2008.06.01 දින දක්වා වැටුප් වර්ධක 11 ක් ගෙවා නොමැති බවත්, ඔහුට ලබා දී ඇති පසු පඩි ගණනය කිරීම වැරදි සහගත බවත් ඉල්ලුම්කරුගේ ස්ථාවරය වේ. ඉදිරිපත් කර ඇති සාක්ෂි අනුව තමාගේ හිඟ වැටුප් නිවැරදි ලෙස ගණනය කර නොමැති බවට ඉල්ලුම්කරු සඳහන් කරන්නේ සේවා තහනමට ලක්ව සිටි කාලය සඳහා අදාළව වැටුප් වර්ධක සහිත වැටුප් ගණනය නොකිරීම් බව පෙනී යයි. එහෙත් වගඋත්තරකාර ආයතනය වන දෙවන පාර්ශවයේ ස්ථාවරය වන්නේ ශ්‍රේෂ්ඨාධිකරණ නියෝගයට අනුව ඔවුන් කටයුතු කර ඇති බවයි.

ඉහත කී ශ්‍රේෂ්ඨාධිකරණ නඩු අංක එස්සී(එෆ්ආර්) 35/2007 නඩුවේ නියෝගය සම්බන්ධයෙන් අවධානය යොමු කරමි. ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ලබාදී ඇති නියෝගයෙන්, බේරුම්කරණ අධිකරණය බැඳී සිටින අතර, ශ්‍රේෂ්ඨාධිකරණ නියෝගයක් අර්ථ නිරූපණය කිරීමේ හෝ වෙනස් කිරීමේ අධිකරණ බලයක් කාර්මික අධිකරණය වෙත නොමැති බව ප්‍රථමයෙන්ම සඳහන් කර සිටිමි.

එකී අංක එස්සී(එෆ්ආර්) 35/2007 නඩුවේ නියෝගයේ සඳහන් කර ඇති කරුණු සම්බන්ධයෙන් සලකා බැලීමේදී සේවා තහනමට ලක්කල දින සිට පසු පඩි සහිතව ඉල්ලුම්කරු නැවත සේවයේ පිහිටුවන ලෙස නියෝග කොට ඇත. උපුටා දැක්වීම “decided to be reinstated the petitioner with effect from the date of interdiction with back wages…………”

සේවය තහනමට ලක්කර දිනයේ සිට පසු පඩි සහිතව ඉල්ලුම්කරු නැවත සේවයේ පිහිටුවීමයි.

තව ද, ඉහත කී එස්සී(එෆ්ආර්) 35/2007 නඩුවේදී පෙත්සම්කරු විසින් ඉල්ලා ඇති සියලුම සහනයන් ලැබී ඇති බවට ද, එකී නියෝගයේ සඳහන් කර ඇත. එකී කොටස පහත උපුටා දක්වමි.

“………… The petitioner has therefore received the entire relief that he has sought in this application…………”

ඉහත කී අංක 35/2007 නඩුවේ පෙත්සම්කාර ඉල්ලුම්කරු විසින් තම පෙත්සමේ ආයාචනය කරන අනෙකුත් කරුණු අතර (*d*) හා (*e*) ඡේදයන්හි ආයාචනය කර ඇති පරිදි ඉල්ලුම්කරු ප්‍රාදේශීය කළමනාකරු ලෙස නැවත සේවයේ පිහිටුවීමටත්, සේවය තහනම් කර දිනයේ සිට එනම් 1998.10.02 වන දින සිට වැටුප් ලබාදීමටත් නියෝග කරන ලෙස ඉල්ලා ඇත. ඒ අනුව ඉහත කී එස්සී(එෆ්ආර්) 35/2007 නඩුවේ නියෝගයට අනුව ප්‍රාදේශීය කළමනාකාර තනතුරේ නැවත ප්‍රතිෂ්ඨාපනය කර ඇති හෙයින් ඒ පිළිබඳ ගැටළුවක් පැන නොනගී.

ඉල්ලුම්කරු විවාදයට ලක් කරන්නේ එකී නියෝගයේ සඳහන් පරිදි 1998.10.02 වන දින සිට හිමිවිය යුතු පසු පඩි (back wages) සම්බන්ධයෙන් වේ. ඉල්ලුම්කරුට සේවා තහනමට ලක්කරන ලද දිනට නියමිත වැටුප් අනුව පසු පඩි ගණනය කර ලැබී ඇති බව ඔහු තමාගේ සාක්ෂියෙන් පිළිගෙන ඇත. එසේ නමුත් ඉල්ලුම්කරු ප්‍රකාශ කර සිටින්නේ සේවා තහනමට ලක් කර සිටි කාලය සඳහා ඔහුට හිමි වැටුප් වර්ධක ගණනය කරමින් ඔහුට හිමි වැටුප් තලයේ පිහිටුවමින් ඔහුට හිමි පසු පඩි ගණනය කර නොමැති බැවින්, වගඋත්තරකාර ආයතනය ඉහත කී එස්සී(එෆ්ආර්) 35/2017 ශ්‍රේෂ්ඨාධිකරණ නියෝගයට අනුව ක්‍රියාකර නොමැති බවය.

මේ අනුව මෙම නඩුවේ දී මා වෙත කර ඇති යොමු කිරීම මගින් බේරුම්කරණය කල යුතු කරුණු අතර, අංක 1 යටතේ සඳහන්ව ඇත්තේ ''………………… අංක 35/2007 හා 2008.06.23 දිනැති ශ්‍රේෂ්ඨාධිකරණ නියෝගය පරිදි 2008.07.17 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි ''ඔහු නියමිත වැටුප් තලය මත'' නැවත සේවයේ පිහිටුවා තිබේද යන්න හා නොඑසේ නම් හිමිවිය යුතු'' සහන මොනවාද යන්න ය.

මා වෙත යොමු කර ඇති යොමු කිරීමේ ඒ අයුරින් සඳහන්ව ඇතත්, ඉහත කී අංක එස්සී(එෆ්ආර්) 35/2007 නඩුවේ නියෝගයේ ''ඔහු නියමිත වැටුප් තලය මත යන්න සඳහන්ව නොමැති බවත්, එහි සඳහන්ව ඇත්තේ පසු පඩි (back wages) යන්න බවත් පළමුවෙන්ම සඳහන් කර සිටිමි. එමෙන්ම එකී නියෝගය දෙපාර්ශවයේ එකඟත්වය මත වූ සමථයක් මත ලබාදෙන ලද නියෝගයක් වන අතර, ඉල්ලුම්කරු විසින් තම පෙත්සමෙන් ඉල්ලා සිටින ලද සියලුම සහන ලැබී ඇති බවටද ගරු ශ්‍රේෂ්ඨාධිකරණය විසින් එකී නියෝගයේ සඳහන් කර ඇති බව මෙහි ලා සඳහන් කරමි.

තව ද, ශ්‍රේෂ්ඨාධිකරණයට ඉදිරිපත් කර ඇති ඉහත සඳහන් එස්සී(එෆ්ආර්) 35/2007 නඩුවේ පෙත්සම්කරු විසින් ඉදිරිපත් කර ඇති පෙත්සමේ කිසිම අවස්ථාවක ඔහු සේවයේ සිටියා නම් හිමිවිය යුතු'' ''නියමිත වැටුප් තලය මත'' පිහිටුවා නැවත සේවයේ පිහිටුවන ලෙස ආයාචනයක් කර නොමැති අතර සේවා තහනමට ලක්කර දින සිට ඔහුගේ වැටුප් ගෙවන ලෙසට ඉල්ලා ඇත. එකී පෙත්සමේ ආයාචනයේ සඳහන් “*e*” ඡේදය උපුටා දක්වමි.

(*e*)“order that the petitioner be paid his salary from the date of interdiction එනම් 1998.10.02''

මේ තත්ත්වය යටතේ ඉහත කී නඩු අංක එස්සී(එෆ්ආර්) 35/2007 නඩුවේ නියෝගයේ සඳහන් ''පසු පඩි'' යන්නට ''නියමිත වැටුප් තලය මත'' යනුවෙන් අර්ථ නිරූපණයක් ලබාදීමට කාර්මික අධිකරණයට අධිකරණ බලයක් නොමැත.

ඉල්ලුම්කරු සේවයේ සිටියා නම් ඔහුට හිමි වැටුප් වර්ධක ලබාගැනීමට අවස්ථාව තිබෙන බවට උපකල්පනය කළ හැක. කෙසේ වෙතත් වැටුප් වර්ධක සම්බන්ධයෙන් පවතින හා අනුගමනය කරනු ලබන සාමාන්‍ය ක්‍රියාපටිපාටිය සළකා බලමු.

වැටුප් වර්ධක සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ දැක්වෙන්නේ මෙසේය. ''නිලධරයෙකුට වැටුප් වර්ධකයක් අයිතිවාසිකමක් වශයෙන් ලබාගැනීමට හිමිකමක් නැති බවත් සිය රාජකාරි කටයුතු කාර්යක්ෂමවත් අනලස්වත් ඉටුකිරීමෙන් හා වැටුප් වර්ධක කාල පරිච්ඡේදය තුළ මුළුමනින්ම සේවය කිරීමෙන් ඔහු එම වැටුප් වර්ධක උපයා ගත යුතු බවත්ය. වැටුප් වර්ධකයක් ගෙවීමට පෙර නිලධරයා විසින් එය උපයා ගැනීමට අවශ්‍ය කරුණු සපුරා ඇති බවට සහතිකයක් නිසි බලධරයා විසින් අත්සන් කළ යුතුය'' යනුවෙන් ය.

එමෙන්ම මෙම නඩුවේ සඳහන් වගඋත්තරකාර ආයතනය විසින් වැටුප් වර්ධක ලබාදීම සම්බන්ධයෙන් අනුගමනය කරන ලද පිරිස් ක්‍රියා පටිපාටි අංක 101 හි සඳහන් වන්නේ ද චේතනාධිකය සේවකයා විසින් උපයාගත යුතු දෙයක් වන බවයි.

තව ද, මෙම නඩුවේ ඉල්ලුම්කරු විසින් දෙන ලද සාක්ෂියේ දී ද චේතනාධිකය උපයාගත යුතු දෙයක් බවට පිළිගෙන ඇත. මේ සියලු කරුණු සළකා බැලීමේදී නිලධරයෙකුට වැටුප් වර්ධකය අයිතිවාසිකමක් වශයෙන් ලබාගැනීමට හිමිකමක් නොමැති බවත්, එය සේවකයකු විසින් උපයාගත යුතු දෙයක් බවත් පැහැදිලි වේ.

ඉල්ලුම්කරුට වැටුප් වර්ධකය උපයා ගැනීමට අවශ්‍ය කරුණු සපුරා ගැනීමට නොහැකි වී ඇත්තේ සේවායෝජක විසින් ඔහුගේ සේවය තහනමට ලක් කළ නිසා බවත් එය සේවායෝජකගේ වරද බවත්, ඔහුට එරෙහිව ගොනු කර තිබූ සියලු චෝදනාවලින් ඔහු නිදහස් වී ඇති බවත්, ඉහත කී 35/2007 නඩුවේ නියෝගයේ සේවා තහනමට ලක් කර දින සිට පසු පඩි සහිතව නැවත සේවයේ පිහිටුවා තිබීමත් යන කරුණු මත ඔහු සේවා තහනමට ලක් කර දින සිට හිමි වැටුප් වර්ධක හිමි විය යුතු බවත් ඒ අනුව ඔහු නියමිත වැටුප් තලයේ පිහිටුවිය යුතු බවත්, මෙම නඩුවේ ඉල්ලුම්කරුගේ ස්ථාවරය වුවත්,

මෙම ඉල්ලුම්කරු විසින් ඉදිරිපත් කරන ලද එස්සීඑෆ්ආර් 35/2007 නඩුවේ දී දෙපාර්ශවයේම එකඟත්වය මත එළඹි සමථයක් මත ශ්‍රේෂ්ඨාධිකරණයෙන් නියෝගයක් ලබාදී ඇති අතර, ඉල්ලුම්කරු විසින් ඉල්ලන ලද සියලුම සහනයන් ලැබී ඇති බවටත්, එකී නියෝගයේ සඳහන්ව ඇති අතර එකී නියෝගයේ පසු පඩි (back wages) සමග නැවත සේවයේ, පිහිටුවන ලෙසට සඳහන්ව ඇති නමුත්

''නියමිත වැටුප් තලය මත'' යන්න සඳහන්ව නොමැත. එමෙන්ම එකී ශ්‍රේෂ්ඨාධිකරණ නියෝගයේ සඳහන් ''පසු පඩි'' යන්නට අර්ථකථනයක් ලබාදීමට බේරුම්කරණයට අධිකරණ බලයක් නොමැත.

ඉහත සඳහන් සියලුම කරුණු සමස්ථයක් වශයෙන් සලකා බැලීමේ දී මෙම නඩුවේ ඉල්ලුම්කරු වන ආර්. ගොඩැල්ලවත්ත මහතා අංක 35/2007 හා 2008.06.23 දිනැති ශ්‍රේෂ්ඨාධිකරණ නියෝගය පරිදි 2008.07.18 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි පසු පඩි සහිතව නැවත සේවයේ පිහිටුවා ඇති බවට නිගමනය කිරීමට සිදුවේ.

2 වන විසඳිය යුතු ප්‍රශ්නය:- අංක 1686 හා 2007.11.06 දිනැති පිරිස් කාර්යාංශ චක්‍රලේඛය පරිදි වසර 10 කට වැඩි කාලයක් එකම ශ්‍රේණියක සිටින සේවකයකු වශයෙන් සලකා උසස්වීම් ලබාගැනීමට හිමිකම් ඇද්ද?

ඉහත සඳහන් උසස්වීම ලබාගැනීම සඳහා ඉල්ලුම්කරු විශ්වාසය තබන්නේ 1686 හා 2007.11.06 දිනැති පිරිස් කාර්යාංශ චක්‍රලේඛය මත බව සාක්ෂිවලින් පැහැදිලි වේ. මෙම චක්‍රලේඛයට අනුව එසේ උසස්වීම් ලබාදීම සඳහා අදාළ යම් යම් කොන්දේසි එහි සඳහන් කර ඇත.

එකී 1686 චක්‍රලේඛයට අනුව මෙම උසස්වීම් ලබාදීම සඳහා සලකා බලන සුදුසුකම් වශයෙන් පහත සඳහන් කරුණු දක්වා ඇත.

01. මෙම උසස්වීම් සඳහා සලකා බලනුයේ 2007.06.30 දිනට සේවයේ යෙදී සිටි හෝ යෙදී සිටින සේවක සේවිකාවන් පමණි.
02. අවම වශයෙන් වසර 10 ක් එකම ශ්‍රේණියේ රැඳී සිටීම හා 2007.06.30 ට පෙර වර්ෂ 10 ක වේතනාධික අඛණ්ඩව උපයාගෙන තිබිය යුතුය.
03. අවම වශයෙන් වසර 20 ක් එකම ශ්‍රේණියේ රැඳී සිටීම හා 2007.06.30 ට පෙර වර්ෂ 10 ක වේතනාධික අඛණ්ඩව උපයාගෙන තිබිය යුතුය.
04. අවම වශයෙන් වසර 20 ක් එකම ශ්‍රේණියේ රැඳී සිටීම හා 2007.06.30 ට පෙර වර්ෂ 20 ක වේතනාධික අඛණ්ඩව උපයාගෙන තිබිය යුතුය.
05. අදාළ කාලසීමාව තුළ කිසිදු විනය ක්‍රියාමාර්ගයකට ලක් නොවිය යුතුය.

සේවා තහනමට ලක්වීම හේතුවෙන් 2007.06.30 දින සේවයේ නොයෙදීම ඉහත සඳහන් පළමු කොන්දේසිය සපුරාලීමට ඉල්ලුම්කරු අපොහොසත් වී ඇත. දෙවන කොන්දේසියේ සඳහන් පරිදි ඉල්ලුම්කරු 2007.06.30 ට පෙර වසර 10 ක වේතනාධික අඛණ්ඩව උපයාගෙන නොමැත. එමෙන්ම එහි සඳහන් (iii) වන කොන්දේසිය සපුරා නැත. (iv) වන කොන්දේසියේ සඳහන් වන්නේ අදාළ කාලසීමාව තුළ කිසිම විනය ක්‍රියාවකට ලක්නොවී තිබිය යුතු බවය. ඉදිරිපත් වී ඇති සාක්ෂිවලට අනුව ඉල්ලුම්කරුගේ ස්ථාවරය වන්නේ ඔහුට සේවයේ රැඳී සිටීමට නොහැකි වූයේ සේවායෝජක විසින් සේවය තහනම් කිරීම හේතුකොටගෙන බැවින් ද සියලු චෝදනාවලින් නිදහස් වී ඇති බැවින් ද එස්සී(එෆ්ආර්) 35/2007 නියෝගයට අනුව වැඩ තහනමට ලක්වූ දින සිට නැවත සේවයේ පිහිට වූ නිසා 1681 පිරිස් කාර්යාංශ චක්‍රලේඛය අනුව උසස්වීම් ලබාගැනීමට අයිතිය ඇති බවය. එය එසේ වුවත් එස්සී(එෆ්ආර්) 35/2007 නඩුවේ නියෝගයට අනුව ඉල්ලුම්කරු සේවා තහනමට ලක්කර දින සිට පසුපඩි සහිතව නැවත සේවයට පත්කර ඇතත් සේවය තහනමට ලක්කර දින සිට ඔහුට හිමි සියලු වැටුප් වර්ධක සහිතව නියමිත වැටුප් තලයේ පිහිටුවා නැවත සේවයේ පිහිටුවන ලෙස නියෝගයක් නොමැතිවීම නිසාත්,

වැටුප් වර්ධක උපයාගත යුතුව ඇති දෙයක් වන හෙයිනුත් ඉහත (ii) වන කොන්දේසිය සපුරාලීම ඉල්ලුම්කරු අපොහොසත් වී ඇත.

තව ද, ඉදිරිපත් වී ඇති සාක්ෂි අනුව විනය පරීක්ෂණ අංක ප්‍රනිනි/වි/2311 සම්බන්ධ 2005.10.03 දින දරන නියෝගයට අනුව චෝදනා දෙකකට වැරදිකරු බව දක්වා ඇති බව ද පැහැදිලිවේ. මේ සියලු කරුණු සැළකිල්ලට ගැනීමේ දී ඉල්ලුම්කරු 1686 පිරිස් කාර්යාංශ චක්‍රලේඛය යටතේ උසස්වීම් ලබාගැනීමට අවශ්‍ය හිමිකම් සපුරාලීමට ඉල්ලුම්කරු අපොහොසත් වී ඇත.

බේරුම්කරණයට යොමුවූ තුන්වන විසඳිය යුතු ප්‍රශ්නය වන්නේ විසි අවුරුදු සේවාව සම්පූර්ණ කිරීම මත ඉල්ලුම්කරුට විසි අවුරුදු තිළිණ ලබාගැනීමට හිමිකම් ලබන්නේ ද යන්නයි. විශේෂ සමරු තිළිණ ලබාගැනීම සඳහා ද ඉහතින් සඳහන් කරන ලද කොන්දේසි සපුරාලිය යුතුව ඇති බව ඉදිරිපත් කර ඇති සාක්ෂිවලින් පෙනී යයි. ඔහු සේවයේ රැඳී නොසිටීම හේතුකොට ගෙන එකී කොන්දේසි සපුරාලීමට නොහැකි වී ඇති බවට ඉල්ලුම්කරුගේ ස්ථාවරයයි. කෙසේ වෙතත් ඉහතින් සඳහන් කරන ලද කරුණු සැලකිල්ලට ගැනීමේදී ඉල්ලුම්කරුට විසි අවුරුදු සේවා තිළිණය ලබාගැනීමට අවශ්‍ය සුදුසුකම් සපුරාලීමට ඉල්ලුම්කරු අපොහොසත් වී ඇත.

ඉහත සඳහන් සියලුම සාක්ෂි සමස්ථයක් වශයෙන් ගෙන සලකා බැලීමේදී, ඉහතින් සඳහන් කර ඇති එස්සී(එෆ්ආර්) 35/2007 දරන, මෙම නඩුවට පදනම වී ඇති නඩුවේ නියෝගය, පාර්ශවකරුවන් අතරේ සමථයකට පත් වී ඇති නියෝගයක් බැවින් ද, එකී

නියෝගයේ නියමිත වැටුප් තලයේ පිහිටුවන ලෙස යනුවෙන් සඳහන් වී නොමැති හෙයින් ද එකී ශ්‍රේෂ්ඨාධිකරණ නියෝගය අර්ථ නිරූපණය කිරීමේ අධිකරණ බලයක් කාර්මික අධිකරණයට නොමැති හෙයින් ද, පසු පඩි සහිතව නැවත සේවයේ පිහිටුවන ලෙසට කර ඇති නියෝගය, සේවා යෝජක වගඋත්තරකරු විසින් නිසියාකාරව ක්‍රියාත්මක කර ඇති බවට නිගමනය කරමි. ඒ අනුව ඉහත කී ශ්‍රේෂ්ඨාධිකරණ නියෝගය ක්‍රියාත්මක කිරීමේදී ඉල්ලුම්කරුට අගතියක් සිදු වී නොමැති බවට නිගමනය කරමි. ඒ අනුව ඉල්ලුම්කරුට සහන ලබාදීමට හැකියාවක් කාර්මික අධිකරණයට නොමැති බවට නිගමනය කරමි.

ඒ අනුව ප්‍රදානයක් නොකරමි. මෙය යුක්තිසහගත හා සාධාරණ නියෝගයක් බවට පිළිගනිමින් නියෝගය ප්‍රකාශයට පත්කරමි.

එන්. ඒ. ජයවික්‍රම මහත්මිය,
බේරුම්කරු.

2018 නොවැම්බර් මස 25 වැනි දින දී ය.

03 – 865

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.